*සැ. යු.* - (i) 2017.07.07 දින පළ වූ අංක 2,027 දරන *ගැසට්* පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.
(ii) මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2017 වර්ෂය සඳහා පොළොන්නරුව අධිකරණ කලාපයට අයත් ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල හා දෙමළ භාෂාවෙන් පමණක් පළ වේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,028- 2017 ජූලි මස 14 වැනි සිකුරාදා - 2017.07.14**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## (IVආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු ..... ... ... | 1108 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 1112 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | 1128 |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.*- (i) පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත 2017 ජූලි මස 07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.
(ii) සිඩ්නි ජයරත්න පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2017 ජූලි මස 07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.
(iii) ජේ ශ්‍රී රංගා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2017 ජූලි මස 07 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ*

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2017 අගෝස්තු මස 04 වැනි දින පළකරන ගැසට් පත්‍රයේ දැන්වීම් 2017 ජූලි මස 21 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (වැ. බ.)

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.


1107 - B 81189— 5,403 (2017/07)
F 1 -

# තනතුරු ඇබෑර්තු

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

### මීගමුව මහා නගර සභාව

මීගමුව මහා නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට විවෘතව බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙළ කරන ලද අයදුම්පත සම්පූර්ණ කර 2017.08.14 දිනට පෙර ඉදිරිපත් කළ යුතු ය.

| *තනතුරු නාමය* | *ශ්‍රේණිය* | *පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව* |
|---|---|---|
| ගිනිභට | - | 04 |
| වැඩ/ක්ෂේත්‍ර කම්කරු | III | 01 |
| වෙළෙඳසැල් පරිපාලක | III | 01 |

**ගිනිභට තනතුරට බඳවා ගැනීමට අදාළ විස්තර :**

*වැටුප් ක්‍රමය* : RS-1-2016 (රු. 29,540 -7 x 300- 27 x 370- -රු. 41,630)
(2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි උපලේඛන II පරිදි ගෙවීම් සිදුකරනු ලැබේ.)

*වයස* : අවුරුදු 19ට නොඅඩු විය යුතු අතර අවුරුදු 25ට නොවැඩි විය යුතුයි.

ජාතික ආධුනිකත්ව මණ්ඩලය මගින් පවත්වනු ලබන ගිනිභට පාඨමාලාව හදරා ඇති අයදුම්කරුවන්ගේ වයස් සීමාව ප්‍රථම වතාවට පමණක් අවුරුදු 35 දක්වා දීර්ඝ කරනු ලැබේ.

*අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් :*

*(අ)* අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් අඩු වශයෙන් වාර දෙකක දී සිංහල/දෙමළ, ගණිතය, විද්‍යාව ඇතුළු විෂයයන් 06කින් සමත් වී තිබිය යුතු අතර ඉන් විෂයයන් 05ක් එක් අවස්ථාවක දී සමත් වී තිබිය යුතු ය.

*(ආ)* විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතු අතර ඔවුන් ;
- (i) අඩි 5 අඟල් 4ක අවම උසකින් යුක්ත විය යුතු ය;
- (ii) රාත්තල් 125 ක අවම බරකින් යුක්ත විය යුතු ය;
- (iii) අයදුම්කරුවන් අවිවාහක විය යුතු ය;
- (iv) බස්නාහිර පළාත තුළ අවම වශයෙන් වසර 03ක ස්ථිර පදිංචියක් තිබිය යුතු ය.

*බඳවා ගැනීමේ ක්‍රමය* : ලිඛිත පරීක්ෂණයක් (සාමාන්‍ය බුද්ධිය පරීක්ෂා කිරීම සඳහා වන පැය 01 ක ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටිය යුතු ය.) හා යෝග්‍යතා පරීක්ෂණයක් (ශාරීරික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා අවස්ථාවෝචිත යෝග්‍යතා පරීක්ෂණයක්) පවත්වා එහි ප්‍රතිඵල මත තෝරාගන්නා අයවළුන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව බඳවා ගැනීම් සිදු කෙරේ.

*සේවා කොන්දේසි :*

- තෝරාගනු ලබන අයදුම්කරුවන් එක් අවුරුදු පුහුණු පාඨමාලාවක් හැදෑරිය යුතු ය. පුහුණු කාලසීමාව තුළ දී වැඩ හා හැසිරීම සතුටුදායක නොවන හෝ අපේක්ෂිත ඵලදායිතා මට්ටමට ළඟාවීමට නොහැකි පුහුණුකරුවන් කිසිම වන්දියකින් තොරව පුහුණුවෙන් ඉවත්කිරීම පත්වීම් බලධාරියාට කළ හැකිය.
- පුහුණු කාලසීමාව තුළ දී රු. 3,000ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

- පුහුණුව සාර්ථකව නිමකරනු ලබන අභ්‍යාසලාභීන් පළාත් රාජ්‍ය සේවයේ ගිනිභට තනතුරට අදළ වැටුප් තලය මත පත්කරනු ලැබේ.
- පුහුණුව සඳහා ඇතුළුවන අවස්ථාවේ දී අභ්‍යාසලාභීන් විසින් පුහුණුව සාර්ථකව නිම කිරීමෙන් අනතුරුව වර්ෂ 05ක කාලයක් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සේවය කරන බවට රු. 10,000ක වටිනාකමින් යුතු බැඳුම්කරයක් අත්සන් කළ යුතුය.
- පුහුණුව ආරම්භ කිරීමට පෙර සියලුම අභ්‍යාසලාභීන් වෛද්‍ය පරීක්ෂණයෙන් සමත්විය යුතුය.
- ගිනිභටයන් වශයෙන් පත්වීම් ලැබූවිට එම පත්වීම්ලාභීන් අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ පදිංචි වීම අනිවාර්යය වේ.

**වැඩ/ක්ෂේත්‍ර කම්කරු තනතුරට බඳවා ගැනීමට අදළ විස්තර :**

වැටුප් ක්‍රමය .- PL-1-2016 (රු. 24,250-10 x 250- 10 x 270-10 x 300 - 12 x 330 -රු. 36,410 )
(2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි උපලේඛන II පරිදි ගෙවීම් සිදුකරනු ලැබේ.)

*අධ්‍යාපන සුදුසුකම්* : 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුය.

*කායික සුදුසුකම්* : තනතුරේ රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

*වයස* : අවම සීමාව - අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු විය යුතුය.
උපරිම සීමාව - අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

*බඳවා ගැනීමේ ක්‍රමය* : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| පළාත් පාලන ආයතනයක අනියම්, ආදේශක. කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇති සේවා කාලය (වසරකට ලකුණු 05 බැගින්) | 15 | |
| තනතුරට අදළව ලබා ඇති පළපුරුද්ද පිළිබඳ වෙනත් සහතික | 05 | |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 75 | 50% |
| පෞරුෂත්වය | 05 | |
| මුළු ලකුණු | 100 | |

**වෛද්‍යසැල් පරිපාලක තනතුරට බඳවා ගැනීමට අදළ විස්තර :**

*වැටුප් ක්‍රමය* : MN-1-2016 (රු. 27,140-10 x 300- 11 x 350-10 x 495 - 10 x 660 -රු. 45,540 )
(2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි උපලේඛන II පරිදි ගෙවීම් සිදු කරනු ලැබේ.)

*අධ්‍යාපන සුදුසුකම්* : සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් ව තිබීම;

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් ව තිබීම.

*කායික සුදුසුකම්* : තනතුරේ රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

*වයස* : අවම සීමාව - අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු විය යුතුයි.
: උපරිම සීමාව - අවුරුදු 30ට නොවැඩි විය යුතුයි.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

01. **ලිඛිත විභාගය :**

| *විෂයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අභියෝග්‍යතාව හා බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 100 | 40% |

***සටහන*** : ලකුණු ලබා ගැනීමේ අනුපිළිවෙල අනුව වැඩි ලකුණු ලබාගත් අයගෙන් පුරප්පාඩු පුරවනු ලැබේ.

02. **සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :**

මෙහි දී ලකුණු ලබාදෙනු නොලැබේ. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පමණක් පවත්වනු ලැබේ.

*වෙනත්* :
(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම
(ii) අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු වීම
(iii) විශිෂ්ඨ චරිතයකින් යුක්ත වීම
(iv) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට් පත්‍රයේ* සඳහන්වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණකර තිබිය යුතුය.

*තනතුරෙහි ස්වභාවය* : ස්ථිර, විශ්‍රාම වැටුප් සහිතය.

- පත්වීම ලබා වසර 5ක් ඉක්මවීමට පෙර අංක 01/2014 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව අදළ භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.
- වැන්දඹු හා අනත්දරු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි :*

තෝරාගනු ලබන්නන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, බස්නාහිර පළාත් සභා මුල්‍ය රීති සංග්‍රහයට ද, කලින්කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි හා නියෝගවලට ද බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින්කල පනවනු ලබන රෙගුලාසි හා නියෝගවලට ද, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝගවලට ද, ආයතන ප්‍රධානියා විසින් නිකුත්කරනු ලබන නියෝගවලට ද අනුව කටයුතු කළ යුතුය.

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ :*

බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ කිසිවක් වෙතොත් ඒ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව/බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා කටයුතු කෙරෙනු ඇත.

නාගරික කොමසාරිස්,
මීගමුව.

## ගිනිහට/වැඩ/ක්ෂේත්‍ර කම්කරු/වෙළෙඳසැල් පරිපාලක තනතුරු සඳහා අයදුම් පත්‍රය

*මීගමුව මහා නගර සභාව*

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

1. මුලකුරු සමග නම : ----------------------------------------------
2. සම්පූර්ණ නම : ----------------------------------------------
3. ඉල්ලුම් කරන තනතුර : ----------------------------------------------
4. ජාතික හැඳුනුම්පත් අංකය : ---------------------- දුරකථන අංකය : ----------------------
5. ස්ථිර පදිංචි ලිපිනය : ----------------------------------------------
6. තැපැල් ලිපිනය : ----------------------------------------------
7. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : ----------------------------------------------
8. ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ----------------------------------------------
9. ස්ථිර පදිංචිය දරන පළාත් පාලන ආයතන බල ප්‍රදේශ : ----------------------------------------------
10. උපන් දිනය : ----------------------------------------------
11. 2017.08.14 දිනට වයස : ----------------------------------------------
12. අධ්‍යාපන සුදුසුකම් : ----------------------------------------------------------------------------------------

----------------------------------------------------------------------------------------

----------------------------------------------------------------------------------------

----------------------------------------------------------------------------------------

(ඡායා පිටපත් ඇමිණිය යුතුය)

13. වෙනත් සුදුසුකම් : ----------------------------------------------------------------------------------------

----------------------------------------------------------------------------------------

----------------------------------------------------------------------------------------

14. වෙළෙඳසැල් පරිපාලක හා ගිනිහට තනතුරු සඳහා ලිඛිත විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල ☐ දෙමළ ☐ ඉංග්‍රීසි ☐

15. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරු කර තිබේද යන වග : --------------------------------------

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ විශ්වාසයේ හා දැනීමේ හැටියට නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. යම් තොරතුරක් සාවද්‍ය බව බඳවා ගැනීමට පෙර හෙළිදරව් වුවහොත් මා නුසුදුස්සෙකු කිරීමට, බඳවා ගැනීමෙන් පසුව හෙළිදරව් වුවහොත් සේවයෙන් පහ කිරීමටත් යටත් වන බව හොඳාකාරවම දනිමි.

--------------------------

අයදුම්කරුගේ අත්සන.

දිනය :--------------------------

07-383

# පළාත් පාලන නිවේදන

### වැලිගම නගර සභාව

### සම්මත අතුරු ව්‍යවස්ථා පිළිගැනීම

**1952 අංක 06 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ තුන්වන වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය**

255 වන අධිකාරි නගර සභා ආඥා පනතේ 184 (අ) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තිය යටතේ සඳහන් විධිවිධාන අනුව වර්ෂ 2017 ක් වූ මාර්තු මස 14 වන දින අංක 2189 යටතේ පහත සඳහන් තීරණ ගන්නට යෙදුන බව මෙයින් නිවේදනය කරමි.

1989 අංක 12 දරන පළාත් සභා (අනුශංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ දෙවන වගන්තිය යටතේ දකුණු පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වශයෙන් සාදන ලදුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1811 හා 2013.05.17 වන දින දරන *ගැසට් පත්‍රයේ* පලකරන ලද කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා 1989 අංක 12 දරන පළාත් සභා අනුශාංගික විධි විධාන පනතේ වැඩි දුරටත් සඳහන් විධිවිධාන අනුව දකුණු පළාත් සභාව විසින් 2013.07.23 දින අනුමත කර ඇති බව 2014.08.29 වන දින 1878 දරන *ගැසට් පත්‍රයේ* පල කර ඇත.

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තිය යටතේ වැඩිදුරටත් සඳහන් විධිවිධාන අනුව එකී සම්මත අතුරු ව්‍යවස්ථාවල I වැනි කොටසේ සිට XXX වැනි කොටස දක්වා ඇති අතුරු ව්‍යවස්ථා වැලිගම නගර සභා බල ප්‍රදේශය සඳහා 2017.03.14 දින සිට අදාළ විය යුතු බවට 255 වන අධිකාරිය නගර සභා ආඥාපනතේ 184 (අ) වන වගන්තිය යටතේ තීරණය කරමි.

තවද, මෙම තීරණය ගනු ලබන 2017.03.14 දින සිට වැලිගම නගර සභා බල ප්‍රදේශය සඳහා 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තිය යටතේ අදාළ කර ගනිමින් බලාත්මක වූ මෙහි උපලේඛන ගත නාමයන් යටතේ විස්තර කරන සම්මත අතුරු ව්‍යවස්ථා යටතේ එතෙක් ගනු ලැබූ තීරණයන්ට අගතියක් නොවන පරිදි 2017.03.14 දිනෙන් පසුවට වැලිගම නගර සභා බල ප්‍රදේශය සඳහා අදාළ නොවිය යුතු බවට ද 255 වන අධිකාරියේ නගර සභා ආඥාපනතේ 184 (අ) වගන්තිය යටතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව තීරණය කරමි.

චන්ද්‍රා අබේගුණවර්ධන,
ලේකම්,
නගර සභාව වැලිගම.

*ඉහත කී උපලේඛනය*

1. මාළු විකිණීම පිළිබඳ උපනීති
2. මස් විකිණීම පිළිබඳ උපනීති
3. සිසිල් බීම හා කර්මාන්ත ශාලා පිළිබඳ උපනීති
4. බේකරි පිළිබඳ අතුරු ව්‍යවස්ථා
5. කිරි පට්ටි හා කිරි විකිණීම පිළිබඳ උපනීති
6. බත් කඩ, ආපන ශාලා, තේ හා කෝපි කඩ
7. භෝජන ශාලා පිළිබඳ උපනීති
8. ලොන්ඩරි පිළිබඳ උපනීති
9. පොදු වෙළෙඳ පොල පවත්වාගෙන යාමට අදළ අතුරු ව්‍යවස්ථා
10. ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථා
11. ලැගුම්හල් පිළිබඳ උපනීති
12. නගර සභාවේ රැස්වීම් පිළිබඳ උපනීති
13. බාබර් සාප්පු පිළිබඳ උපනීති
14. අයිස් කර්මාන්ත ශාලා

07-435

## පූජාපිටිය ප්‍රාදේශීය සභාව

2017 වර්ෂය විනෝද බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9:3 වගන්තිය සමග කියවිය යුතු විනෝද බදු ආඥපනතේ 2 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙහි පහත සඳහන් තීරණය 2017.05.29 දින අංක 685 යටතේ ගන්නට යෙදුනු බව මෙයින් නිවේදනය කරමි. තව ද මෙකී බදු ප්‍රතිශතය සඳහා ගරු විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබීමෙන් අනතුරුව, *ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් වන දිනක සිට හෝ එහි සඳහන් ඉදිරි දිනක සිට ක්‍රියාත්මක වන බව වැඩි දුරටත් නිවේදනය කරමි.

චාමින්දි අමදෝරු,
ලේකම්,
පූජාපිටිය ප්‍රාදේශීය සභාව,
පූජාපිටිය.

2017 මැයි මස 30 වැනි දින,
පූජාපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9:3 වගන්තිය සමග කියවිය යුතු විනෝද බදු ආඥ පනතේ 2 වන වගන්තිය අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව විනෝද බදු ආඥ පනත යටතට ගැනිය හැකි විනෝද බදු සංදර්ශනයක් පූජාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ, ඇතුල්වීම සඳහා මුදල් අය කරන විට, එසේ ඇතුල්වීම සඳහා අය කරනු ලබන මුදලින් 10%ක ප්‍රතිශතයක් යටතේ විනෝද බද්දක් පනවා අයකළයුතු බවට මම තීරණය කරමි.

07-459

---

## අරණායක ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 14 හා 24(2) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර සබරගමුව පළාතේ කෑගලු දිස්ත්‍රික්කයේ, අරණායක ප්‍රාදේශීය සභාව විසින් මෙහි අමුණා ඇති උපලේඛනයේ දක්වා ඇති මංමාවත/ මංමාවත් අරණායක ප්‍රාදේශීය සභාව සතු මංමාවතක්/මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

දැනට ප්‍රාදේශීය සභාව විසින් මැන සලකුණු යොදා ඇති මෙම මංමාවත/මංමාවත් සම්බන්ධයෙන් අදාල ඉඩම් අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශ්වයන් විසින් යම් විරුද්ධත්වයක් පළ කරනු ලබන්නේ නම්, මේ නිවේදනයේ දින සිට මසක් ඇතුලත තමාගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 17 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාලසීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් උපලේඛනයේ සඳහන් මංමාවත/මංමාවත් අරණායක ප්‍රාදේශීය සභාව සතු මංමාවතක්/මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරන බව, පොදු ජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ටී. එම්. චන්ද්‍රාවතී,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
අරණායක.

2017 ජුනි මස 15 වැනි දින,
අරණායක ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

මාර්ගයේ නම :- අස්මඩල සිට වාකිරිගල ඩිස්පෙන්සරිය දක්වා මාර්ගය
මාර්ගයේ ආරම්භය සහ අවසානය :- අස්මඩලේ සිට වාකිරිගල දක්වා
ග්‍රාම සේවා වසම හා අංකය :- අංක 16 ඩී - අස්මඩල
මාර්ගයේ දිග හා පළල :- දිග මීටර් 140, පළල - දැනට පවතින පළල

*මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :*

1. උපතිස්ස බණ්ඩාර මයා - උඩහ වලව්වේවත්ත ඉඩම
2. වාකිරිගල පන්සල් මාර්ගය -
3. පී. ආර්. වසන්ත කුමාර මයා - උඩහවත්ත ඉඩම
4. ජී. ජී. ගුණරත්න මයා - උඩහවත්ත ඉඩම
5. වී. එච්. ජයන්තා නාලනී මිය - උඩහවත්ත ඉඩම
6. ඩී. පී. නිහාල් මයා - උඩහවත්ත ඉඩම
7. ආර්. ඒ. කල්ප ඉසුරංග මයා - උඩහවත්ත ඉඩම
8. පී. ආර්. හීන්බණ්ඩා මයා - උඩහවත්ත ඉඩම
9. එස්. ආර්. රංජිත් සේනානායක මයා - තට්ටුමාරු පහලවත්ත ඉඩම

*මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම:*

1. එස්. ආර්. රංජන් සේනානායක මයා - උඩහවත්ත ඉඩම
2. ඒ. ජී. ගුණතිලක මයා - උඩහවත්ත ඉඩම
3. ඩී. පී. සමරකොන් මයා - උඩහවත්ත ඉඩම
4. එස්. ආර්. රංජිත් සේනානායක මයා - තට්ටුමාරු පහලවත්ත ඉඩම

බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත් මයාගේ 2016.01.09 වැනි දින මනින ලද පිඹුරුපත් අංක 12/2016 දරන පිඹුරුපත අනුව වේ.


එච්.එම්.ආර්.ටී.කේ.හේරත්,
බලයලත් මිනින්දෝරු තලම්තිකරු,
උසාවි කොමසාරිස් සහ තක්සේරුකරු,
පින්නවල, රඹුක්කන.
ලියාපදිංචි අංකය: 19831492

පිඹුරු අංකය: 12/2016

## අස්මඩල සිට වාකිරිගල ඩිස්පැන්සරිය දක්වා මාර්ගය

පරිමාණය 1:1000

යොමුව :- අරණායක ප්‍රාදේශීය සභා සභාපතිගේ අංක
අර/ප්‍රාස/07/මාර්ග මැනුම් හා 2006.10.04 දින ලිපිය




සත්‍ය පිටපතක් බව සහතික කරමි

........................................
ලේකම්
අරණායක ප්‍රාදේශීය සභාව

## සබරගමුව පළාතේ

## කෑගල්ල දිස්ත්‍රික්කයේ

ගල්බොඩ කෝරළේ එගොඩපොත සහ තනිප්පේරු පත්තුවේ
අස්මඩල ගමේ පිහිටි උඩග වලව්වේ වත්ත, උඩගවත්ත සහ තට්ටුමාරු පහලවත්ත
යන ඉඩම් හරහා පවතින මාර්ගය මැන සාදන ලද

### -පිඹුර-

| කැබලි අංකය | මාර්ගයේ වර්ග ප්‍රමාණය | | | | දිග(මීටර) | පළල(අඩි) | කිවයුතු කරුණු |
|---|---|---|---|---|---|---|---|
| | හෙක්ටයාර් | අ | රූ | පර් | | | |
| 1 | 0.0570 | 00 | 0 | 22.53 | 140.00 | දැනට පවතින පළල | ——— |

මායිම් පෙන්වා දුන් අය }
මායිම් බලා ගත් අය } ඉඩම් හිමිකරුවන්

2016-01-10

මනින ලද්දේ : 2016.01.09 වන දින

එච්.එම්.ආර්.ටී.කේ. හේරත්
බලයලත් මිනින්දෝරු තලම්තිකරු
උසාවි කොමසාරිස් සහ තක්සේරුකරු
ටෙලි : 035-2266422/077 4973610
~~ලි.ප. අංකය: 19831492~~

## පේදුරුතුඩුව නගර සභාව

### මාර්ගවල නම් ප්‍රකාශයට පත් කිරීම

1939 අංක 61 දරන නගර සභා පනතේ (255 වන අධිකාරිය) 44, 46 හා 49 යන වගන්ති යටතේ යාපනය දිස්ත්‍රික්කයේ පේදුරුතුඩුව නගර සභාවේ අංක 151 හා 2017.06.23 දිනැති තීරණයට අනුව පේදුරුතුඩුව නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ පහත නාමලේඛනයේ දැක්වෙන මාර්ග, මෙම නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පේදුරුතුඩුව නගර සභාවට අයිති හෝ සතු කළ මාර්ග වශයෙන් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

1939 අංක 61 දරන නගර සභා පනතේ (255 වන අධිකාරිය) 44, 46 හා 49 යන වගන්ති යටතේ හඳුනා ගනු ලැබූ එම මාර්ග පිහිටා ඇති ඉඩමට, අයිතිකරු ලෙස හිමිකම් පාන යම් පාර්ශ්වයක් සිටී නම්, එම පාර්ශ්වය තමන්ට ඇති අයිතිය ඔප්පු කිරීමට අදළ ලියකියවිලි සමග තමන්ගේ විරෝධතාවය *ගැසට් පත්‍රයේ* මෙම දැන්වීම පළ කරනු ලැබූ දිනයේ සිට මාසයක කාල සීමාව ඇතුළත මා වෙත ඉදිරිපත් කිරීමට හැකිය. *නැතහොත්* එම පාර්ශ්වයට ඇති අයිතිය ස්ථාවරත්ව කිරීම පිණිස පේදුරුතුඩුව නගර සභාව වෙත මාසයකට පෙර දැන්වීමක් කර, *ගැසට් පත්‍රයේ* මෙම දැන්වීම පළ කරනු ලැබූ දිනයේ සිට මාස තුනක කාලය ඇතුළත නිසි අධිකරණයෙහි නඩුවක් පැවරිය යුතු බව මෙයින් ප්‍රසිද්ධියේ දැනුම් දෙමි.

පුවනේන්තිරන් රමේෂ්වරන්,
ලේකම්,
පේදුරුතුඩුව නගර සභාව.

පේදුරුතුඩුව නගර සභාව,
පේදුරුතුඩුව,
2017 ජුනි මස 23 වැනි දින.

**උපලේඛනය**

***ග්‍රාම නිලධාරිගේ කොට්ඨාසයේ - පේදුරුතුඩුව J/401***

| වීථියේ අංකය | වීථියේ නම | ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නම | ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අංකය | පාරට වෙනත් නමක් භාවිතා කරන්නේ නම් | ආරම්භක ස්ථානය | අවසාන ස්ථානය | දිග ප්‍රමාණය (m) | කොට්ඨාසය | පළල ප්‍රමාණය (m) |
|---|---|---|---|---|---|---|---|---|---|
| NJPUE001 | සුප්පර් මඩිම් වීථිය | පේදුරුතුඩුව | J/401 | ආලඩි වීථිය | පේදුරුතුඩුව- පොන්නාලේ වීථිය | වියාපාරිමූලේ වීථිය | 447 | 1 | 4.5 |
| NJPUE002 | මුනිස්වරර් වීථිය | පේදුරුතුඩුව | J/401 | | පේදුරුතුඩුව - පොන්නාලේ වීථිය | සුප්පර්මඩම් වීථිය | 145 | 1 | 3.0 |
| NJPUE003 | විදුහල් පාර | පේදුරුතුඩුව | J/401 | ඩී.සී වීථිය | පේදුරුතුඩුව - පොන්නාලේ වීථිය | තම්බසිඩ්ඩි වීථිය | 1245 | 1,2,9 | 6.0 |
| NJPUE004 | මෙදඩිස් පාසල පිට්ටනියේ පටුමග | පේදුරුතුඩුව | J/401 | | විදුහල් පාර | ආලඩි පිල්ලෙයාර් කෝවිල | 128 | 1 | 6.0 |

| වීථියේ අංකය | වීථියේ නම | ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නම | ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ අංකය | පාරට වෙනත් නමක් භාවිතා කරන්නේ නම් | ආරම්භක ස්ථානය | අවසාන ස්ථානය | දිග ප්‍රමාණය (m) | කොට්ඨාසය | පළල ප්‍රමාණය (m) |
|---|---|---|---|---|---|---|---|---|---|
| NJPUE005 | විනායගමුදලියාර් වීථිය | පේදුරුතුඩුව | J/401 | | පේදුරුතුඩුව - පොන්නාලේ වීථිය | තම්බසිඩ්ඩි වීථිය | 1200 | 2,3,9 | 6.0 |
| NJPUE006 | උසාවිය වීථිය | පේදුරුතුඩුව | J/401 | | පේදුරුතුඩුව වීථිය | විදුහල් පාර | 420 | 2,3 | 6.0 |
| NJPUE007 | පත්තිරකාලි අම්මන් වීථිය | පේදුරුතුඩුව | J/401 | | පේදුරුතුඩුව වීථිය | විනායගමුදලියාර් වීථිය | 300 | 2,3 | 3.0 |
| NJPUE008 | පොළ බටහිර වීථිය | පේදුරුතුඩුව | J/401 | | පත්තිරකාලි අම්මන් වීථිය | උසාවිය වීථිය | 280 | 3 | 3.0 |
| NJPUE009 | පරණ උඩයාර් වීථිය | පේදුරුතුඩුව | J/401 | | විනායගමුදලියාර් වීථිය | පත්තිරකාලි අම්මන් වීථිය | 160 | 3 | 3.0 |
| NJPUE010 | මුහුදු වෙරළ පාර | පේදුරුතුඩුව | J/401 | | වරාය | 4 වැනි හරස් පාර | 800 | 3 | 20.0 |
| NJPUE011 | 1 වැනි හරස් පාර | පේදුරුතුඩුව | J/401 | | මුහුදු වෙරළ පාර | තුම්පලේ වීථිය | 320 | 3, 4 | 6.0 |
| NJPUE012 | මුහුදු වෙරළ 3 වැනි පටුමග | පේදුරුතුඩුව | J/401 | | මුහුදු වෙරළ පාර | තක්සේරු අංකයක් 60/11 | 92 | 4 | 3.0 |
| NJPUE013 | මුහුදු වෙරළ 4 වැනි පටුමග | පේදුරුතුඩුව | J/401 | | මුහුදු වෙරළ පාර | තක්සේරු අංකයක් 66/18 | 195 | 4 | 3.0 |
| NJPUE014 | මුහුදු වෙරළ 5 වැනි පටුමග | පේදුරුතුඩුව | J/401 | | මුහුදු වෙරළ පාර | තක්සේරු අංකයක් 110/15 | 186 | 4 | 3.0 |
| NJPUE015 | තුම්පලේ වීථිය | පේදුරුතුඩුව | J/401 | | පේදුරුතුඩුව වීථිය | 4 වැනි යාකරන වීථිය | 470 | 4 | 20.0 |
| NJPUE016 | 2 වැනි හරස යාකරන වීථිය | පේදුරුතුඩුව | J/401 | | 1 වැනි හරස් පාර | 2 වැනි හරස් පාර | 90 | 4 | 6.0 |
| NJPUE017 | 2 වැනි හරස් පාර | පේදුරුතුඩුව | J/401 | | මුහුදු වෙරළ පාර | තුම්පලේ වීථිය | 530 | 4 | 6.0 |

| වීථියේ අංකය | වීථියේ නම | ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නම | ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අංකය | පාරට වෙනත් නමක් භාවිතා කරන්නේ නම් | ආරම්භක ස්ථානය | අවසාන ස්ථානය | දිග ප්‍රමාණය (m) | කොට්ඨාසය | පළල ප්‍රමාණය (m) |
|---|---|---|---|---|---|---|---|---|---|
| NJPUE018 | 3 වැනි හරස් යා කරන වීථිය 1 | පේදුරුතුඩුව | J/401 | | 2 වැනි හරස් පාර | 3 වැනි හරස් පාර | 200 | 4 | 4.0 |
| NJPUE019 | 3 වැනි හරස් යාකරන වීථිය 2 | පේදුරුතුඩුව | J/401 | නරසිංගවෛරවර් කෝවිල් වීථිය | 3 වැනි හරස් පාර | 4 වැනි හරස් පාර | 190 | 4 | 3.0 |
| NJPUE020 | 3 වැනි හරස් පාර | පේදුරුතුඩුව | J/401 | | මුහුදු වෙරළ පාර | තුම්පලේ වීථිය | 510 | 4 | 6.0 |
| NJPUE021 | පේදුරුතුඩුව වීථිය 1 වැනි පටුමග | පේදුරුතුඩුව | J/401 | | පේදුරුතුඩුව වීථිය | 2 වැනි හරස් පාර | 184 | 4 | 6.0 |

**ග්‍රාම නිලධාරි කොට්ඨාසය - පේදුරුතුඩුව දකුණ J/402**

| වීථියේ අංකය | වීථියේ නම | ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නම | ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අංකය | පාරට වෙනත් නමක් භාවිතා කරන්නේ නම් | ආරම්භක ස්ථානය | අවසාන ස්ථානය | දිග ප්‍රමාණය (m) | කොට්ඨාසය | පළල ප්‍රමාණය (m) |
|---|---|---|---|---|---|---|---|---|---|
| NJPUE022 | ආත්තියඩි වීථිය | පේදුරුතුඩුව දකුණ | J/402 | | විදුහල් පාර | විනායගමුදලියාර් වීථිය | 460 | 2 | 6.0 |
| NJPUE023 | ඕඩික්කරේ වීථිය | පේදුරුතුඩුව දකුණ | J/402 | | විදුහල් පාර | විනායගමුදලියාර් වීථිය | 287 | 2 | 4.5 |
| NJPUE024 | පේච්චි අම්මන් වීථිය | පේදුරුතුඩුව දකුණ | J/402 | | විදුහල් පාර | ආත්තියඩි ඩච් වෙල්ලවාය්කාල් වීථිය | 80 | 2 | 3.0 |
| NJPUE025 | ඕඩික්කරෙ වීරපත්තිරර් වීථිය | පේදුරුතුඩුව දකුණ | J/402 | | විදුහල් පාර | ආත්තියඩි ඩච් වෙල්ලවාය්කාල් වීථිය | 60 | 2 | 3.0 |
| NJPUE026 | ආත්තියඩිඩච් වෙල්ලවාය්කාල් වීථිය | පේදුරුතුඩුව දකුණ | J/402 | | තම්බසිඩඩි වීථිය | විදුහල් පාර | 490 | 2 | 4.0 |
| NJPUE027 | එයනාර් කලඩ්ඩි වීථිය | පේදුරුතුඩුව දකුණ | J/402 | | පේදුරුතුඩුව වීථිය | විනායගමුදලියාර් වීථිය | 870 | 2,3,9 | 6.0 |

| වීථියේ අංකය | වීථියේ නම | ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නම | ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අංකය | පාරට වෙනත් නමක් භාවිතා කරන්නේ නම් | ආරම්භක ස්ථානය | අවසාන ස්ථානය | දිග ප්‍රමාණය (m) | කොට්ඨාසය | පළල ප්‍රමාණය (m) |
|---|---|---|---|---|---|---|---|---|---|
| NJPUE028 | නාගලිංගමුදලියාර් වීථිය | පේදුරුතුඩුව දකුණ | J/402 | | පත්තිරකාලි අම්මන් වීථිය | වෛයනාර් කලඩඩි වීථිය | 270 | 2, 3 | 4.0 |
| NJPUE029 | පූදවරායර් වීථිය | පේදුරුතුඩුව දකුණ | J/402 | | පේදුරුතුඩුව වීථිය | නාගලිංගමුදලියාර් වීථිය | 280 | 3 | 3.0 |
| NJPUE030 | පේදුරුතුඩුව වීථිය 7 වැනි පටුමග | පේදුරුතුඩුව දකුණ | J/402 | සෙඩ්ඩිත්තෙරු 2 | පේදුරුතුඩුව වීථිය | තක්සේරු අංකයක් 290/9 | 177 | 3 | 3.0 |

**ග්‍රාම නිලධාරිගේ කොට්ඨාසයේ - පේදුරුතුඩුව නැගෙනහිර J/403**

| වීථියේ අංකය | වීථියේ නම | ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නම | ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අංකය | පාරට වෙනත් නමක් භාවිතා කරන්නේ නම් | ආරම්භක ස්ථානය | අවසාන ස්ථානය | දිග ප්‍රමාණය (m) | කොට්ඨාසය | පළල ප්‍රමාණය (m) |
|---|---|---|---|---|---|---|---|---|---|
| NJPUE031 | මුහුදු වෙරළ 7 වැනි පටුමග | පේදුරුතුඩුව නැගෙනහිර | J/403 | | මුහුදු වෙරළ පාර | වෙලංකන්නි පෙර පාසල 90/11 | 170 | 4 | 4.0 |
| NJPUE032 | මුහුදු වෙරළ 8 වැනි පටුමග | පේදුරුතුඩුව නැගෙනහිර | J/403 | සින්නතෝඩම් වීථිය | මුහුදු වෙරළ පාර | තක්සේරු අංකයක් 94/24 | 231 | 4 | 4.5 |
| NJPUE033 | මුහුදු වෙරළ 9 වැනි පටුමග | පේදුරුතුඩුව නැගෙනහිර | J/403 | | මුහුදු වෙරළ පාර | තක්සේරු අංකයක් 100/9 | 168 | 4 | 4.0 |
| NJPUE034 | මුහුදු වෙරළ 10 වැනි පටුමග | පේදුරුතුඩුව නැගෙනහිර | J/403 | | මුහුදු වෙරළ පාර | තක්සේරු අංකයක් 108/10 | 110 | 4 | 4.0 |
| NJPUE035 | මුහුදු වෙරළ 12 වැනි පටුමග | පේදුරුතුඩුව නැගෙනහිර | J/403 | චම්පලබෝඩයි වීථිය | මුහුදු වෙරළ පාර | තක්සේරු අංකයක් 26 | 202 | 4 | 3.0 |
| NJPUE036 | සෙන් තෝමස් වීථිය | පේදුරුතුඩුව නැගෙනහිර | J/403 | | පේදුරුතුඩුව මරුදංකේණි වීථිය | සෙන් අන්රනිස් වීථිය | 320 | 4 | 4.5 |
| NJPUE037 | 4 වැනි හරස් යා කරන වීථිය | පේදුරුතුඩුව නැගෙනහිර | J/403 | මිලි පෙරමුනේ වීථිය | 3 වැනි හරස් පාර | 4 වැනි හරස් පාර | 410 | 4 | 4.5 |
| NJPUE038 | 4 වැනි යා කරන වීථිය | පේදුරුතුඩුව නැගෙනහිර | J/403 | | මුහුදු වෙරළ පාර | තුම්පලේ වීථිය | 600 | 4 | 6.0 |

| වීථියේ අංකය | වීථියේ නම | ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නම | ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ අංකය | පාරට වෙනත් නමක් භාවිතා කරන්නේ නම් | ආරම්භක ස්ථානය | අවසාන ස්ථානය | දිග ප්‍රමාණය (m) | කොට්ඨාසය | පළල ප්‍රමාණය (m) |
|---|---|---|---|---|---|---|---|---|---|
| NJPUE039 | සෙන් අන්රනිස් වීථිය | පේද්‍රුරුතුඩුව නැගෙනහිර | J/403 | | 4 වැනි හරස් පාර | මණල් වීථිය | 360 | 4,5 | 4.5 |
| NJPUE040 | තුම්පලේ වීථිය 5 වැනි පටුමග | පේද්‍රුරුතුඩුව නැගෙනහිර | J/403 | වොදවනම් වීථිය | තම්බසිඩ්ඩ් වීථිය | තක්සේරු අංකයක් 105/10 | 136 | 4 | 3.0 |
| NJPUE041 | තුම්පලේ වීථිය 7 වැනි පටුමග | පේද්‍රුරුතුඩුව නැගෙනහිර | J/403 | | තම්බසිඩ්ඩ් වීථිය | තක්සේරු අංකයක් 113/17 | 65 | 4 | 3.0 |
| NJPUE042 | පිල්ලෙයාර් කෝවිල් වීථිය | පේද්‍රුරුතුඩුව නැගෙනහිර | J/403 | | තුම්පලේ වීථිය | මරුදංකේණි වීථිය (වී.ස.බ.ම) | 1200 | 5 | 6.0 |
| NJPUE043 | පිල්ලෙයාර් කෝවිල් 1 වැනි පටුමග | පේද්‍රුරුතුඩුව නැගෙනහිර | J/403 | | පිල්ලෙයාර් කෝවිල් වීථිය | පිල්ලෙයාර් කෝවිල් වීථිය | 205 | 5 | 4.5 |
| NJPUE044 | මණල් වීථිය | පේද්‍රුරුතුඩුව නැගෙනහිර | J/403 | | පේද්‍රුරුතුඩුව මරුදංකේණි වීථිය | තුම්පලේ වීථිය | 770 | 5 | 6.0 |
| NJPUE045 | තුරේතෝඩ්ඩම් වීථිය | පේද්‍රුරුතුඩුව නැගෙනහිර | J/403 | | මණල් වීථිය | ප්‍රදීපාගාර වීථිය | 230 | 5 | 4.5 |
| NJPUE046 | දේවමාදා වීථිය | පේද්‍රුරුතුඩුව නැගෙනහිර | J/403 | | තුම්පලේ වීථිය | පිල්ලෙයාර් කෝවිල් වීථිය | 400 | 5 | 6.0 |
| NJPUE047 | දේවමාදා ප්‍රදීපාගාර යාකරන වීථිය | පේද්‍රුරුතුඩුව නැගෙනහිර | J/403 | | දේවමාදා වීථිය | ප්‍රදීපාගාර වීථිය | 210 | 5 | 4.0 |
| NJPUE048 | ප්‍රදීපාගාර වීථිය | පේද්‍රුරුතුඩුව නැගෙනහිර | J/403 | | පේද්‍රුරුතුඩුව මරුදංකේණි වීථිය | තුම්පලේ වීථිය | 1050 | 5 | 6.0 |
| NJPUE049 | ලූර්ත්තුමාදා වීථිය | පේද්‍රුරුතුඩුව නැගෙනහිර | J/403 | | පිල්ලෙයාර් කෝවිල් වීථිය | ප්‍රදීපාගාර වීථිය | 420 | 5 | 4.5 |
| NJPUE050 | මණල් පටුමග පිල්ලෙයාර් කෝවිල් යාකරන වීථිය | පේද්‍රුරුතුඩුව නැගෙනහිර | J/403 | | මණල් වීථිය | පිල්ලෙයාර් කෝවිල් 1 වැනි පටුමග | 100 | 5 | 4.0 |
| NJPUE051 | මුහුදු වෙරළ 14 වැනි පටුමග | පේද්‍රුරුතුඩුව නැගෙනහිර | J/403 | | පේද්‍රුරුතුඩුව මරුදංකේණි වීථිය | තක්සේරු අංකයක් 176/08 | 105 | 5 | 3.0 |

| වීථියේ අංකය | වීථියේ නම | ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නම | ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අංකය | පාරට වෙනත් නමක් භාවිතා කරන්නේ නම් | ආරම්භක ස්ථානය | අවසාන ස්ථානය | දිග ප්‍රමාණය (m) | කොට්ඨාසය | පළල ප්‍රමාණය (m) |
|---|---|---|---|---|---|---|---|---|---|
| NJPUE052 | මුහුදු වෙරළ 15 වැනි පටුමග | පේදුරුතුඩුව නැගෙනහිර | J/403 | | පේදුරුතුඩුව මරුදංකේණි වීථිය | තක්සේරු අංකයක් 186/03 | 140 | 5 | 3.0 |
| NJPUE053 | මුහුදු වෙරළ 18 වැනි පටුමග | පේදුරුතුඩුව නැගෙනහිර | J/403 | | පේදුරුතුඩුව මරුදංකේණි වීථිය | තක්සේරු අංකයක් 248/20 | 177 | 5 | 3.0 |
| NJPUE054 | මුහුදු වෙරළ 19 වැනි පටුමග | පේදුරුතුඩුව නැගෙනහිර | J/403 | | පේදුරුතුඩුව මරුදංකේණි වීථිය | තක්සේරු අංකයක් 260/11 | 174 | 5 | 3.0 |
| NJPUE055 | මුහුදු වෙරළ 20 වැනි පටුමග | පේදුරුතුඩුව නැගෙනහිර | J/403 | | පේදුරුතුඩුව මරුදංකේණි වීථිය | තක්සේරු අංකයක් 264/17 | 219 | 5 | 3.0 |
| NJPUE056 | මුහුදු වෙරළ 21 වැනි පටුමග | පේදුරුතුඩුව නැගෙනහිර | J/403 | කෝයඩි වීථිය | පේදුරුතුඩුව මරුදංකේණි වීථිය | ප්‍රදීපාගාර වීථිය | 220 | 5 | 4.5 |
| NJPUE057 | තුම්පලේ වීථිය 11 වැනි පටුමග | පේදුරුතුඩුව නැගෙනහිර | J/403 | | තුම්පලේවීථිය | තක්සේරු අංකයක් 159/10 | 60 | 5 | 4.0 |

***ග්‍රාම නිලධාරිගේ කොට්ඨාසයේ - තුම්පලේ J/404***

| වීථියේ අංකය | වීථියේ නම | ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නම | ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අංකය | පාරට වෙනත් නමක් භාවිතා කරන්නේ නම් | ආරම්භක ස්ථානය | අවසාන ස්ථානය | දිග ප්‍රමාණය (m) | කොට්ඨාසය | පළල ප්‍රමාණය (m) |
|---|---|---|---|---|---|---|---|---|---|
| NJPUE058 | පෙරුවෙඩ්ඩි වීථිය | තුම්පලේ | J/404 | | තුම්පලේ වීථිය | ආරියන්කලඩ්ඩි වීථිය | 1170 | 7, 8 | 6.0 |
| NJPUE059 | ආරියන්කලඩ්ඩි වීථිය | තුම්පලේ | J/404 | | තිකිරි වීථිය | පෙරුවෙඩ්ඩි වීථිය | 300 | 7 | 4.0 |
| NJPUE060 | කලප්පනාවත්තේ වීථිය | තුම්පලේ | J/404 | | තුම්පලේ වීථිය | ලච්චුමණන් තෝඩ්ඩම් වීථිය | 650 | 5,6 | 4.5 |
| NJPUE061 | සාස්තිරියාර් වීථිය | තුම්පලේ | J/404 | | පෙරුවෙඩ්ඩි වීථිය | කලප්පනාවත්තේ වීථිය | 530 | 5,7 | 6.0 |
| NJPUE062 | කලප්පනාවත්තේ 1 වැනි පටුමග | තුම්පලේ | J/404 | | කලප්පනාවත්තේ වීථිය | තක්සේරු අංකයක් 19/12 | 125 | 5,6 | 4.0 |
| NJPUE063 | සාස්තිරියාර් වීථිය 1 වැනි පටුමග | තුම්පලේ | J/404 | | සාස්තිරියාර් වීථිය | තක්සේරු අංකයක් 49/18 | 155 | 5 | 4.5 |

| වීථියේ අංකය | වීථියේ නම | ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නම | ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ අංකය | පාරට වෙනත් නමක් භාවිතා කරන්නේ නම් | ආරම්භක ස්ථානය | අවසාන ස්ථානය | දිග ප්‍රමාණය (m) | කොට්ඨාසය | පළල ප්‍රමාණය (m) |
|---|---|---|---|---|---|---|---|---|---|
| NJPUE064 | සාස්තිරියාර් වීථිය 2 වැනි පටුමග | තුම්පලේ | J/404 | ඔදියඩි වෛරවර් කෝවිල් වීථිය | සාස්තිරියාර් වීථිය | ඔටියඩි වෛරවර් කෝවිල් | 65 | 5 | 4.5 |
| NJPUE065 | තිකිරි වීථිය | තුම්පලේ | J/404 | | තුම්පලේ වීථිය | ලච්චුමණන් තෝඩ්ඩම් වීථිය | 720 | 5, 7 | 6.0 |
| NJPUE066 | මුරුගන් කෝවිල් වීථිය | තුම්පලේ | J/404 | | තුම්පලේ වීථිය | සන්තිසීමා වීථිය | 428 | 6 | 4.5 |
| NJPUE067 | සන්තිසීමා වීථිය | තුම්පලේ | J/404 | | පේදුරුතුඩුව මරුදංකේණි වීථිය (වී.ස.බ.ම) | කලප්පනාවත්තේ වීථිය | 310 | 6 | 6.0 |
| NJPUE068 | තඩ්ඩාතෙරු | තුම්පලේ | J/404 | | සන්තිසීමා වීථිය | ලච්චුමණන් තෝඩ්ඩම් වීථිය | 300 | 6 | 4.5 |
| NJPUE069 | ලච්චුමණන් තෝඩ්ඩම් වීථිය | තුම්පලේ | J/404 | | පේදුරුතුඩුව මරුදංකේණි වීථිය (වී.ස.බ.ම) | සන්තිසීමා වීථිය | 530 | 6 | 4.5 |
| NJPUE070 | වළලායි වීථිය | තුම්පලේ | J/404 | | තකිරි වීථිය | පෙරුවෙඩ්ඩි වීථිය | 390 | 7 | 4.5 |
| NJPUE071 | අරසඩි වීථිය | තුම්පලේ | J/404 | | කලිමන්ර වීථිය | කොටාකල්ලඩි වීථිය | 800 | 7 | 6.0 |
| NJPUE072 | වරදවිනායගර් වීථිය | තුම්පලේ | J/404 | | අරසඩි වීථිය | සාස්තියාර් වීථිය | 227 | 7 | 4.5 |
| NJPUE073 | පිරාමණර් වීථිය | තුම්පලේ | J/404 | | අම්පුලියෝඩෙ වීථිය | පෙරුවෙඩ්ඩි වීථිය | 250 | 7 | 4.0 |
| NJPUE074 | සේර්විල් වීථිය | තුම්පලේ | J/404 | | සාස්තිරියාර් වීථිය | වරදවිනායගර් වීථිය | 200 | 7 | 4.5 |
| NJPUE075 | මුදලි කෝවිල් වීථිය | තුම්පලේ | J/404 | | මාදනේ වීථිය | මාදනේ කාලිකෝවිල් | 225 | 8 | 4.0 |
| NJPUE076 | යාලප්පේ වීථිය | තුම්පලේ | J/404 | | 1 වැනි සැතපුම් වීථිය | පෙරුන්තෙරු | 230 | 8 | 6.0 |

*ග්‍රාම නිලධාරි කොට්ඨාසය - තුම්පලේ නැගෙනහිර **J/405***

| වීථියේ අංකය | වීථියේ නම | ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නම | ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අංකය | පාරට වෙනත් නමක් භාවිතා කරන්නේ නම් | ආරම්භක ස්ථානය | අවසාන ස්ථානය | දිග ප්‍රමාණය (m) | කොට්ඨාසය | පළල ප්‍රමාණය (m) |
|---|---|---|---|---|---|---|---|---|---|
| NJPUE077 | නෙල්ලණ්ඩෙ නැගෙනහිර වීථිය | තුම්පලේ නැගෙනහිර | J/405 | | නෙල්ලණ්ඩේ අම්මන් කෝවිල් | තක්සේරු අංකයක් 77 | 495 | 6 | 6.0 |
| NJPUE078 | තොඩ්ඩක්කඩවේ වෛරවර් කෝවිල් වීථිය | තුම්පලේ නැගෙනහිර | J/405 | | පේදුරුතුඩුව මරුදංකේණි වීථිය | නෙල්ලණ්ඩේ නැගෙනහිර වීථිය | 280 | 6 | 4.5 |
| NJPUE079 | වක්කමෝඩේ වීථිය | තුම්පලේ නැගෙනහිර | J/405 | | පේදුරුතුඩුව මරුදංකේණි වීථිය | තුම්පලෙ නැගෙනහිර මුහුදු | 890 | 6 | 4.5 |
| NJPUE080 | උද්සූරියන් වීථිය | තුම්පලේ නැගෙනහිර | J/405 | | පේදුරුතුඩුව මරුදංකේණි වීථිය | තුම්පලෙ නැගෙනහිර මුහුදු | 455 | 6 | 6.0 |
| NJPUE081 | උද්සූරියන් 1 වැනි පටුමග | තුම්පලේ නැගෙනහිර | J/405 | | උද්සූරියන් වීථිය | වක්කමෝඩේ වීථිය | 105 | 6 | 4.5 |
| NJPUE082 | උද්සූරියන් 2 වැනි පටුමග | තුම්පලේ නැගෙනහිර | J/405 | | උද්සූරියන් වීථිය | උද්සූරියන් පෙර පාසල | 112 | 6 | 4.5 |
| NJPUE083 | උඩයාර් වීථිය | තුම්පලේ නැගෙනහිර | J/405 | | පේදුරුතුඩුව මරුදංකේණි වීථිය (වී.ස.බ.ම) | තුම්පලෙ නැගෙනහිර මුහුදු | 660 | 6 | 4.5 |
| NJPUE084 | සීමාව වීථිය | තුම්පලේ නැගෙනහිර | J/405 | | පේදුරුතුඩුව මරුදංකේණි වීථිය (වී.ස.බ.ම) | තුම්පලෙ නැගෙනහිර මුහුදු | 800 | 6 | 6.0 |
| NJPUE085 | සීමාව වීථිය 2 වැනි පටුමග | තුම්පලේ නැගෙනහිර | J/405 | | සීමාව වීථිය | සක්දි කෝවිල් වීථිය | 226 | 6 | 4.5 |
| NJPUE086 | මුත්තුමාරි අම්මන් කෝවිල් වීථිය | තුම්පලේ නැගෙනහිර | J/405 | | උඩයාර් වීථිය | නෙල්ලණ්ඩේ නැගෙනහිර | 172 | 6 | 4.5 |
| NJPUE087 | තුම්පලෙ නැගෙනහිර මුහුදු පිල්ලෙයාර් කෝවිල් වීථිය | තුම්පලේ නැගෙනහිර | J/405 | | උද්සූරියන් වීථිය | තක්සේරු අංකයක් 59/15 | 243 | 6 | 4.5 |

| වීථියේ අංකය | වීථියේ නම | ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නම | ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අංකය | පාරට වෙනත් නමක් භාවිතා කරන්නේ නම් | ආරම්භක ස්ථානය | අවසාන ස්ථානය | දිග ප්‍රමාණය (m) | කොට්ඨාසය | පළල ප්‍රමාණය (m) |
|---|---|---|---|---|---|---|---|---|---|
| NJPUE088 | සක්දි කෝවිල් වීථිය | තුම්පලේ නැගෙනහිර | J/405 | | සීමාව වීථිය | තොඩ්ඩක්කඩ්වේ වෛරවර් කෝවිල් වීථිය | 190 | 6 | 4.5 |
| NJPUE089 | සීමාව වීථිය 3 වැනි පටුමග | තුම්පලේ නැගෙනහිර | J/405 | කාදවරායර් වීථිය | සීමාව වීථිය | නෙල්ලණ්ඩේ නැගෙනහිර | 210 | 6 | 4.5 |

**ග්‍රාම නිලධාරිගේ කොට්ඨාසයේ - පුලෝලි උතුර J/407**

| වීථියේ අංකය | වීථියේ නම | ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නම | ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අංකය | පාරට වෙනත් නමක් භාවිතා කරන්නේ නම් | ආරම්භක ස්ථානය | අවසාන ස්ථානය | දිග ප්‍රමාණය (m) | කොට්ඨාසය | පළල ප්‍රමාණය (m) |
|---|---|---|---|---|---|---|---|---|---|
| NJPUE090 | පේදුරුතුඩුව වීථිය 6 වැනි පටුමග | පුලෝලි උතුර | J/407 | සෙඩ්ඩිත්තෙරු 1 | පේදුරුතුඩුව වීථිය | තක්සේරු අංකයක් 249/28 | 165 | 7 | 3.0 |
| NJPUE091 | පේදුරුතුඩුව වීථිය 8 වැනි පටුමග | පුලෝලි උතුර | J/407 | සෙඩ්ඩිත්තෙරු 3 | පේදුරුතුඩුව වීථිය | තක්සේරු අංකයක් 279/23 | 125 | 7 | 4.0 |
| NJPUE092 | පේදුරුතුඩුව වීථිය 11 වැනි පටුමග | පුලෝලි උතුර | J/407 | | පේදුරුතුඩුව වීථිය | තක්සේරු අංකයක් 325/7 | 100 | 7 | 6.0 |
| NJPUE093 | කලිමන්ර වීථිය | පුලෝලි උතුර | J/407 | | පේදුරුතුඩුව වීථිය | පෙරුවෙඩ්ඩි වීථිය | 650 | 7 | 6.0 |
| NJPUE094 | අම්පුලියෝඩේ වීථිය | පුලෝලි උතුර | J/407 | | තුම්පලේ වීථිය | කලිාමන්ර වීථිය | 497 | 7 | 6.0 |
| NJPUE095 | මාදනේ වීථිය | පුලෝලි උතුර | J/407 | | කලිාමන්ර වීථිය | මාදනේ කාලිකෝවිල් වීථිය | 550 | 7 | 6.0 |
| NJPUE096 | මාදනේ කාලිකෝවිල් වීථිය | පුලෝලි උතුර | J/407 | | පෙරුවෙඩ්ඩි වීථිය | පෙරුන්තෙරු | 230 | 8 | 4.0 |
| NJPUE097 | තුම්පලේ වීථිය 2 වැනි පටුමග | පුලෝලි උතුර | J/407 | සිවන් නැගෙනහිර වීථිය | තම්බසිඩ්ඩි වීථිය | තක්සේරු අංකයක් 70 | 110 | 7 | 4.0 |

| වීථියේ අංකය | වීථියේ නම | ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නම | ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අංකය | පාරට වෙනත් නමක් භාවිතා කරන්නේ නම් | ආරම්භක ස්ථානය | අවසාන ස්ථානය | දිග ප්‍රමාණය (m) | කොට්ඨාසය | පළල ප්‍රමාණය (m) |
|---|---|---|---|---|---|---|---|---|---|
| NJPUE098 | කිලුවපෙ වීථිය | පුලෝලි උතුර | J/407 | | කලිමන්ර වීථිය | මරුතඩි වීථිය | 135 | 9 | 4.0 |
| NJPUE099 | තුම්පලේ වීථිය 6 වැනි පටුමග | පුලෝලි උතුර | J/407 | | තුම්පලේ වීථිය | තක්සේරු අංකයක් 98/9 | 90 | 7 | 4.0 |
| NJPUE100 | 1 වැනි සැතපුම් වීථිය | පුලෝලි උතුර | J/407 | | පේදුරුතුඩුව වීථිය | මාදනේ කණ්ණකි අම්මන් කෝවිල් | 120 | 8 | 6.0 |
| NJPUE101 | කල්ලඩි වීථිය | පුලෝලි උතුර | J/407 | | තුම්පලේ වීථිය | අම්පුලියෝඩේ වීථිය | 165 | 8 | 4.0 |
| NJPUE102 | පන්නක්කඩ්ඩේ වීථිය | පුලෝලි උතුර | J/407 | | තුම්පලේ වීථිය | අරසඩි වීථිය | 510 | 7 | 6.0 |
| NJPUE103 | පන්නක්කඩ්ඩේ පිල්ලෙයාර් උතුරු වීථිය | පුලෝලි උතුර | J/407 | | කල්ලඩි වීථිය | පන්නක්කඩ්ඩේ වීථිය | 200 | 7 | 4.0 |
| NJPUE104 | පෙරුන්තෙරු | පුලෝලි උතුර | J/407 | | පේදුරුතුඩුව වීථිය | මාදනේ පිල්ලෙයාර් වීථිය | 1100 | 8 | 6.0 |
| NJPUE105 | වීරපත්තිරර් කෝවිල් වීථිය | පුලෝලි උතුර | J/407 | | පෙරුන්තෙරු | 1 වැනි සැතපුම් වීථිය | 300 | 8 | 4.5 |
| NJPUE106 | පේදුරු තුඩුව වීථිය 14 වැනි පටුමග | පුලෝලි උතුර | J/407 | තාමර් වීථිය | පෙරුන්තෙරු | පේදුරුතඩුව වීථිය | 300 | 9 | 4.0 |
| NJPUE107 | තඩ්ඩාතෙරු | පුලෝලි උතුර | J/407 | | පෙරුන්තෙරු | 1 වැනි සැතපුම් වීථිය | 390 | 9 | 4.5 |
| NJPUE108 | වීරසොලන් වීථිය | පුලෝලි උතුර | J/407 | | මාදනේ වීථිය | මාදනේ කාලිකෝවිල් වීථිය | 145 | 8 | 4.0 |
| NJPUE109 | මරුතඩි වීථිය | පුලෝලි උතුර | J/407 | | පේදුරුතුඩුව වීථිය | පෙරුන්තෙරු | 132 | 9 | 4.5 |
| NJPUE110 | කොටාකල්ලඩි වීථිය | පුලෝලි උතුර | J/407 | | තිකිරි වීථිය | ආරියන්කලඩි වීථිය | 300 | 7 | 4.5 |

| ග්‍රාම නිලධාරිගේ කොට්ඨාසයේ - පුලෝලි මධ්‍යය J/409 | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| වීථියේ අංකය | වීථියේ නම | ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නම | ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අංකය | පාරට වෙනත් නමක් භාවිතා කරන්නේ නම් | ආරම්භක ස්ථානය | අවසාන ස්ථානය | දිග ප්‍රමාණය (m) | කොට්ඨාසය | පළල ප්‍රමාණය (m) |
| NJPUE111 | වියාපාරිමූලේ වීථිය | පුලෝලි මධ්‍යය | J/409 | | විදුහල් පාර | කදිරවේට්පිල්ලේ වීථිය | 450 | 1 | 6.0 |
| NJPUE112 | කදිරවේට්පිල්ලේ වීථිය | පුලෝලි මධ්‍යය | J/409 | | තම්බසිඩ්ඩි වීථිය | වියාපාරිමූලේ වීථිය | 745 | 1 | 6.0 |
| NJPUE113 | පණ්ඩිරි අම්මන් කෝවිල් වීථිය | පුලෝලි මධ්‍යය | J/409 | | තම්බසිඩ්ඩි වීථිය | කදිරවේට්පිල්ලේ වීථිය | 354 | 1 | 6.0 |
| NJPUE114 | තාළ්වුකලඩ්ඩි වීථිය | පුලෝලි මධ්‍යය | J/409 | | තම්බසිඩ්ඩි වීථිය | කදිරවේට්පිල්ලේ වීථිය | 673 | 1 | 6.0 |
| NJPUE115 | කෝණන්තිව් වීථිය | පුලෝලි මධ්‍යය | J/409 | | විදුහල් පාර | විදුහල් පාර 2 වැනි පටුමග | 585 | 1 | 4.5 |
| NJPUE116 | මාලන්තෙණි මුරුගන් කෝවිල් වීථිය | පුලෝලි මධ්‍යය | J/409 | කදිරවේට්පිල්ලේ වීථිය 2 වැනි පටුමග | කදිරවේට්පිල්ලේ වීථිය | පණ්ඩාර් අම්මන් කෝවිල් වීථිය | 205 | 1 | 4.5 |
| NJPUE117 | විදුහල් පාර 12 වැනි පටුමග | පුලෝලි මධ්‍යය | J/409 | | විදුහල් පාර | පණ්ඩාරි අම්මන් කෝවිල් වීථිය | 474 | 1 | 4.5 |
| NJPUE118 | විදුහල් පාර 13 වැනි පටුමග | පුලෝලි මධ්‍යය | J/409 | | විදුහල් පාර | තක්සේරු අංකයක් 209/6 | 70 | 9 | 3.0 |
| NJPUE119 | විදුහල් පාර 05 වැනි පටුමග | පුලෝලි මධ්‍යය | J/409 | | විදුහල් පාර | තක්සේරු අංකයක් 56/7 | 102 | 1 | 4.5 |
| NJPUE120 | වියාපාරිමූලේ වීථිය 1 වැනි පටුමග | පුලෝලි මධ්‍යය | J/409 | නාවලඩි වීථිය | වියාපාරිමූලේ වීථිය | කෝණන්තිව් වීථිය | 425 | 1 | 4.5 |
| NJPUE121 | කදිරවේට්පිල්ලේ වීථිය 10 වැනි පටුමග | පුලෝලි මධ්‍යය | J/409 | තම්බසිඩ්ඩි පටුමග | කදිරවේට්පිල්ලේ වීථිය | පණ්ඩාරි අම්මන් කෝවිල් වීථය | 110 | 1 | 3.0 |

| වීථියේ අංකය | වීථියේ නම | ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නම | ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අංකය | පාරට වෙනත් නමක් භාවිතා කරන්නේ නම් | ආරම්භක ස්ථානය | අවසාන ස්ථානය | දිග ප්‍රමාණය (m) | කොට්ඨාසය | පළල ප්‍රමාණය (m) |
|---|---|---|---|---|---|---|---|---|---|
| NJPUE122 | කදිරවේට්පිල්ලේ වීථිය 9 වැනි පටුමග | පුලෝලි මධ්‍යය | J/409 | තම්බසිඩ්ඩි පටුමග | කදිරවේට්පිල්ලේ වීථිය | පණ්ඩිරි අම්මන් කෝවිල් වීථය | 100 | 1 | 4.0 |
| NJPUE123 | වෙල්ලවායිකාල් වීථිය | පුලෝලි මධ්‍යය | J/409 | | විදුහල් පාර 2 වැනි පටුමග | කෝණන්තිව් වීථිය | 295 | 1 | 4.5 |
| NJPUE124 | පේදුරුතුඩුව වීථිය 15 වැනි පටුමග | පුලෝලි මධ්‍යය | J/409 | | පේදුරුතුඩුව වීථිය | තක්සේරු අංකයක් 466/8 | 74 | 1 | 4.0 |
| NJPUE125 | තම්බසිඩ්ඩි වීථිය 1 වැනි පටුමග | පුලෝලි මධ්‍යය | J/409 | | තම්බසිඩ්ඩි වීථිය | තක්සේරු අංකයක් 24/14 | 165 | 9 | 4.5 |
| NJPUE126 | කන්තලඩියාර් වීථිය | පුලෝලි මධ්‍යය | J/409 | | පේදුරුතුඩුව වීථිය | විනායගමුදලියාර් වීථිය | 480 | 9 | 4.5 |
| NJPUE127 | කලඩ්ඩිවලවු වීථිය | පුලෝලි මධ්‍යය | J/409 | | මෙයනාර් කලඩ්ඩි වීථිය | කන්තලඩයාර් වීථිය | 290 | 9 | 4.5 |

*ග්‍රාම නිලධාරිගේ කොට්ඨාසයේ - නිරිත දෙසින් J/411*

| වීථියේ අංකය | වීථියේ නම | ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නම | ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අංකය | පාරට වෙනත් නමක් භාවිතා කරන්නේ නම් | ආරම්භක ස්ථානය | අවසාන ස්ථානය | දිග ප්‍රමාණය (m) | කොට්ඨාසය | පළල ප්‍රමාණය (m) |
|---|---|---|---|---|---|---|---|---|---|
| NJPUE128 | තම්බසිඩ්ඩි වීථිය | නිරිත දෙසින් | J/411 | | පේදුරුතුඩුව වීථිය | තම්බසිඩ්ඩි වීථිය | 1120 | 1, 9 | 6.0 |
| NJPUE129 | කාර්තිකේයර් වීථිය | නිරිත දෙසින් | J/411 | | තම්බසිඩ්ඩි වීථිය | පේදුරුතුඩුව ප්‍රාදේශීය සභා සීමාව | 90 | 9 | 4.5 |

# ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන

## මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධියට පත්කිරීම

### පන්නල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව පන්නල ප්‍රාදේශීය සභාවේ ලේකම් එච්.ජේ.එම්.එම්.එස්. ජයසුන්දර වන මම ප්‍රාදේශීය සභාවේ 2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධියට පත්කිරීමට 2017.05.26 දිනැති අංක 3636 දරන තීරණය යටතේ මා විසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එච්.ජේ.එම්.එම්.එස්. ජයසුන්දර,
ලේකම් හා බලතල කාර්යය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ
නිලධාරී,
පන්නල ප්‍රාදේශීය සභාව

2017 මැයි මස 31 වැනි දින,
පන්නල ප්‍රාදේශීය සභාවේ දී ය.

**පන්නල ප්‍රාදේශීය සභාව**

***2016 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශය***

| | *සටහන්* Notes | *2016.12.31* | *2015.12.31* |
|---|---|---|---|
| මෙහෙයුම් අයභාරය | | | |
| රජයේ දායකත්වය - පුනරාවර්තන | 01 | 174,129,366.49 | 112,405,899.55 |
| වෙනත් අයභාරය | 02 | 46,118,918.09 | 39,550,438,83 |
| මුළු මෙහෙයුම් අයභාරය A | | 220,248,284.58 | 151,956,338.38 |
| මෙහෙයුම් වියදම | | | |
| පුනරාවර්තන වියදම් | 03 | 113,481,902.22 | 111,657,516.54 |
| මුළු මෙහෙයුම් වියදම B | | 11,381,902.22 | 111,657,516.54 |
| වර්ෂය සඳහා වන මෙහෙයුම් අතිරික්තය/ ඌනතාවය | A-B=C | 106,766,382.36 | 40,298,821.84 |
| ප්‍රාග්ධන ලැබීම් D | 04 | 22,312,564.73 | 30,051,802.28 |
| ප්‍රාග්ධන වියදම් E | 05 | 39,926,585.72 | 25,937,318.66 |
| වර්ෂය සඳහා වන අතිරික්තය/ ඌනතාවය | C+D-E=F | 89,152,361.37 | 44,413,305.46 |

**පන්නල ප්‍රාදේශීය සභාව**

*2016 දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය*

| | සටහන් | 2016.12.31 | 2015.12.31 |
|---|---|---|---|
| වත්කම් | | | |
| ජංගම නොවන වත්කම් | | | |
| දේපළ පිරියත හා උපකරණ | 06 | 316,737,377.50 | 314,577,237.55 |
| ජංගම වත්කම් | | | |
| තොග | 07 | 1,880,229.81 | 2,853,460.95 |
| සේවක ණය හා අත්තිකාරම් | 08 | 2,844,277.98 | 2,384,542.81 |
| ලැබිය යුතු දෑ | 09 | 164,150,336.68 | 131,070,073.86 |
| ආයෝජන | 10 | 1,666,704.00 | 702,573.00 |
| මුදල් හා මුදල් සමාන දෑ | 11 | 29,340,702.84 | 26,649,092.68 |
| මුළු වත්කම් | | 516,619,628.81 | 478,236,980.85 |
| වගකීම් | | | |
| ජංගම නොවන වගකීම් | 12 | 35,586,735.66 | 43,135,499.89 |
| ජංගම වගකීම් | 13 | 96,200,539.81 | 135,373,296.52 |
| හිමිකම් | 14 | 384,832,353.34 | 299,728,184.44 |
| මුළු හිමිකම් හා වගකීම් | | 516,619,628.81 | 478,236,980.85 |

**පන්නල ප්‍රාදේශීය සභාව**

*2016 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය*

| | 2016.12.31<br>රු. ශත | 2015.12.31<br>රු. ශත |
|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය | | |
| සාමාන්‍ය මෙහෙයුම් වලින් ලද අතිරික්තය / ඌනතාවය | 106,766,382.36 | 40,298,821.84 |
| පෙර වර්ෂය සඳහා ගැලපීම් | (6,208,332.42) | (75,382,167.28) |
| කාරක ප්‍රාග්ධනය වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් අතිරික්තය/ ඌනතාවය | 100,558,049.94 | (35,083,345.44) |
| තොග ණයගැතියන්/ අනෙකුත් ලැබීම් - වැඩිවීම් (අඩුවීම්) | (33,530,897.85) | 92,828,213.06 |
| ණයහිමියන්/ ගෙවිය යුතු දෑ - වැඩිවීම් (අඩුවීම්) | (39,172,756.71) | (47,643,872.25) |
| 01. මෙහෙයුම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | 27,854,395.38 | 10,100,995.37 |

| | | 2016.12.31<br>රු. ශත | 2015.12.31<br>රු. ශත |
|---|---|---|---|
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | | |
| දේපළ අත්පත් කරගැනීම්/ ඉවත් කිරීම් | | (2,160,139.95) | (5,503,346.24) |
| ප්‍රාග්ධන වියදම් | | (37,766,445.77) | (20,433,972.42) |
| 02. ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | (39,926,585.72) | (25,937,318.66) |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | | |
| ප්‍රාග්ධන ලැබීම් | | 22,312,564.73 | 30,051,802.28 |
| ණය ආපසු ගෙවීම් | | (7,548,764.23) | (7,218,781.98) |
| 03. මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | | 14,763,800.50 | 22,833,020.30 |
| වර්ෂය තුළ ශුද්ධ චලනයන් (1 + 2 + 3) | | 2,691,610.16 | 6,996,697.01 |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ | | 26,649,092.68 | 19,652,395.67 |
| වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන II) | | 29,340,702.84 | 26,649,092.68 |
| සටහන II ලංකා බැංකුවේ ජංගම ගිණුම | 3003334 | 22,548,580.68 | 21,280,790,78 |
| ලංකා බැංකුවේ ජංගම ගිණුම | 3003340 | 3,239,300.22 | 1,729,878.84 |
| ලංකා බැංකුවේ ජංගම ගිණුම | 73559037 | 2,555,763.56 | 2,004,220.46 |
| ලංකා බැංකුවේ ජංගම ගිණුම | 70551597 | 428,844.38 | 868.774.38 |
| ලංකා බැංකුවේ ජංගම ගිණුම | 3441122 | 336,718.89 | 71,726.04 |
| ලංකා බැංකුවේ ජංගම ගිණුම | 3003335 | 160,778.79 | 616,121.36 |
| නිලධාරි අතැති මුදල් | | 2,309.33 | 2,309.33 |
| ඉතිරි මුද්දර | | 35,157.50 | 40,022.00 |
| අගරු චෙක් | | 33,249.49 | 33,249.49 |
| | | 29,340,702.84 | 26,649,092.68 |

07-330

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.